# පුරාණ ඉන්දු ආර්ය භාෂාවල දිස්වන ඍ කාරය පාලි භාෂාවට බිඳී එන විවිධාකාරය පිළිබඳ අධ්‍යයනයක්

පනාමුරේ චන්දිම හිමි[1]
මැදවෙල ධම්මධාරිණී මෙහෙණිය[2]

## හැඳින්වීම

ස්වභාවිකවම මිනිසාගේ කටින් පිටවන විවිධ ශබ්ද අදාළකරගෙන එම ශබ්ද ලිඛිතව ප්‍රකාශ කිරීම සඳහා යොදා ගනු ලබන සංකේත මාලාව අක්ෂර මාලාව යනුවෙන් හඳුන්වනු ලබයි. ලෝකයේ ඇති භාෂාවන් අතර ඉන්දු ආර්ය භාෂාවන්ට හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. අනාධිමත් කාලයක් තිස්සේ විවිධ භාෂාවන් විවිධ පරිණාමයන්ට ලක් වෙමින් නූතනය දක්වා ද පවතී. එක් භාෂාවක අක්ෂරවල ලක්ෂණ තවත් භාෂාවක අක්ෂරයන්ට අසමානය. එහෙත් ශබ්දය සෑම භාෂාවකම පාහේ පොදුය. ඒ අනුව ඇතැම් භාෂාවල අක්ෂර මාලාවන්හි විවිධ වෙනස්කම් දක්නට ලැබේ. පාලි භාෂාවේ දැකිය හැක්කේ ස්වර අක්ෂර අටක් පමණි. එහෙත් ඇතැම් භාෂාවක ස්වර අකුරු දහහතරක් දැකිය හැකිය. තවත් භාෂාවක එය ඊට වඩා අඩු හෝ වැඩි විය හැකිය. එම නිසා එක් භාෂාවක ඇති අඩු අක්ෂර ප්‍රමාණයෙන් වැඩි ශබ්ද ගණනක් ප්‍රකාශ කළ යුතුය.

---

1 කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, chandimapamaure@gmail.com
2 සහය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

### අරමුණ

පුරාණ ඉන්දු ආර්ය යුගයේ භාෂාවල අක්ෂර මාලාවේ ඍ අක්ෂරය දැකිය හැකි අතර සුද්ධ මාගධි හෙවත් පාලි භාෂාවේ එම අක්ෂරය දැකිය නොහැකිය. එනමුදු ඍ අක්ෂරය පාලි භාෂාවට බිඳී එන අවස්ථා සුළභව දැකිය හැකිය. එම අවස්ථාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වෙයි.

### ක්‍රමවේදය

මූලික වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ක්‍රමවේදයයි. ඊට අමතරව ඉන්දු ආර්ය භාෂාවන් පිළිබඳ ලියවී ඇති ද්විතීයික මූලාශ්‍රයන් ද ඇසුරු කර ගනිමින් දත්ත රැස්කිරීම මෙම පර්යේෂණයේ දී අනුගමනය කරන ක්‍රමවේදයයි.

### සාකච්ඡාව

ප්‍රධාන වශයෙන් ඍ කාරය ආකාර තුනකින් පාලි භාෂාවට බිඳී එන අයුරු දැකිය හැකිය. ඇතැම් අවස්ථාවක අ අක්ෂරය ලෙසද තවත් අවස්ථාවක ඉ අක්ෂරය ලෙසද ඇතැම්විට උ අක්ෂරය ලෙසද බිඳී එයි.

ඍ = අ වීම
ඍ = උ වීම

ඍක්ෂ අච්ඡ
ඍජු උජු/ උජ්ජු

වෘක වක
ඍෂභ උසභ

හෘදය හදය
පෘච්ඡති පුච්ඡති

කෘත කත
මෘදු මුදු

ඍ = ඉ ùu

කෘත කිත

මෘත මිත

ඍක්ෂ ඉක්ක

ඍණ ඉණ

මෘත මත

මෘෂා මුසා

දෘඪ දළ්හ

ඍතු උතු

තෘතිය තතිය

තෘෂ්ණා තසිණා

වෘශ්චික විච්ඡික

ඍෂි ඉසි

මෘග මිග

තෘණ තිණ

මීට අමතරව ඇතැම් අවස්ථාවක ඍ කාරය විවිධ ස්වර හා ව්‍යඤ්ජන වන අවස්ථා දැකිය හැකිය. එහෙත් එබඳු අවස්ථා ඇති වී තිබෙන්නේ ඉතා විරල වශයෙන් බවද පෙන්වාදිය හැකිය.

උදාහරණ

ඍ කාරය ඇතැම් අවස්ථාවක එ බවට පත්වන ආකාරය දැකිය හැකිය

ගෘහ ගෙහ

ඍ කාරය ඇතැම් අවස්ථාවලදී ර රි රු බවට පත්වන ආකාරය දැකිය හැකිය.

බෘහත් = බ්‍රහා

වෘක්ෂ = රුක්ඛ

ඍතෙ = රිතෙ

ගෘතෙ = රිතෙ

ප්‍රාවෘත = පාරුත

අපාවෘත = අපාරුත

තවත් අවස්ථාවක§ ඉතා කලාතුරකින් ඍ කාරය ඉරු හා අර බවට පත් වේ.

ඍග්වේද = ඉරුබ්බේද/ ඉරුධ්වේද

නෘපති = නරපති

## නිගමනය

ඉහත දක්වන ලද ආකාරයට පුරාණ ඉන්දු ආර්ය යුගයේ දක්නට ලැබුණු ඍ කාරය විවිධ ස්වරූප මගින් පාලියට බිඳී පැමිණ ඇති බවයි. මෙහිදී විශේෂයෙන් සැළකිය යුතු කරුණක් වන්නේ ඇතැම් ස්ථානවල එකම ශබ්දයේ බිඳී එන ස්වරූප දෙකක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් දක්නට ලැබීමයි. උදාහරණයක් ලෙස කෘත යන පදය පාලි භාෂාවේ කත හා කිත වීම දැක්විය හැකිය. එසේම මෘත යන පදය මත හා මිත වශයෙන් යෙදී තිබීම දැක්විය හැකිය. ඒ අනුව පුරාණ ඉන්දු ආර්ය භාෂාවල දක්නට ලැබුණු ඍ කාරය පාලි භාෂාවට විවිධ ස්වරූපයන්ගෙන් පැමිණ ඇති ආකාරය නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද - ඉන්දු ආර්ය භාෂා, ඍ කාරය, වෙනස් වීම, පාලි භාෂාව

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

01. ගුණරතන හිමි, මොරටුවේ, පාලි ව්‍යාකරණය, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නව මුද්‍රණය 2001

02. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, යුනියන් මුද්‍රණාලය අම්බලන්ගොඩ. 1946

03. විමල් ජී බලගල්ලේ භාෂාධ්‍යයන ලිපි-1 එස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 2004

04. රාහුල හිමි, හොරණ කහටපිටියේ, ශ්‍රී ලංකාවේ පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්. 1996

05. ඩබ්. ඇස්. කරුණාතිලක ඓතිහාසික වාග් විද්‍යාව. එස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 2006